**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - 2017**

---------------------------------------------------------

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත 2018 මැයි 25 දින නිකුත්කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත 5(ආ) වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂය හා 2017 වර්ෂය වෙනුවෙන් එකී වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අටවන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව වෙනුවෙන් 2015 වර්ෂයේ සිට ගෙවිය යුතුව පවතින (Biennial Conference on Science and Technology VIII) රු.50,000 ක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,141,953 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.826,191 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,315,762 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.3,693,175 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂවලදී මූල්‍ය ඌනතාවයන් ඇති වී තිබූ අතර 2013 වර්ෂයේදී රු.130,785 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,141,953 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම්වලට අදාල ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.12,779,734 ක්වූ දායකත්වය 2016 වර්ෂය වනවිට රු.19,194,406 ක් දක්වා අඛණ්ඩව වර්ධනයවී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.15,642,745 දක්වා අඩු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවේ ජංගම අනුපාතය 0.95 සිට 0.28 දක්වාද ක්ෂණික අනුපාතය 0.91 සිට 0.26 දක්වාද පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ජංගම වගකීම් රු.4,262,526 කින් ඉහල යාම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබූ අතර කාරක ප්‍රාග්ධන ගැටලු ඇතිවීමේ අවධානමක් පැවතිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

සභාව විසින් 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(අ) වගන්තියේ සඳහන් කොමිෂන් සභාවේ කර්තව්‍යයන්ට අදාල ප්‍රතිපත්ති සැලසුම්ද ඇතුළුව විද්‍යාව හා තාක්ෂණයේ වර්ධනය සඳහා ප්‍රතිපත්ති සැලසුම් සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම කොමිෂන් සභාවේ කර්තව්‍ය විය. එහෙත් 2017 වර්ෂයේදී සභාව විසින් ඒ අනුව කටයුතු කර තිබූ බවට වූ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) නොබැඳි ජාතීන්ගේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM) වෙත සමාලෝචිත වර්ෂය තුලදී වාර්ෂික දායක ගාස්තුව ලෙස රු.3,063,459 ක මුදලක් ගෙවීම්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී එම මධ්‍යස්ථානය මගින් පවත්වා තිබූ වැඩමුළු 06 න් වැඩමුළු 04 ක් සඳහා පමණක් ශ්‍රී ලාංකික නියෝජිතයන් සහභාගී කර තිබුණි.

(ඇ) ආයතනික සමාලෝචනය (Institutional Reviews) යටතේ 2017 වර්ෂයේදී රාජ්‍ය හා පෞද්ගලික ආදී ආයතන 05 ක් සමාලෝචනය කර තිබුණද එම කටයුතු නිමකර තිබුණේ ආයතන දෙකක පමණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (NRDF) යටතේ යෝජිත වැඩසටහන් 30 ක් ක්‍රියාත්මක කර නිම කිරීමට සැලසුම්කර තිබුණද වර්ෂය තුළ වැඩසටහන් 12 ක් පමණක් නිමකර තිබුණි.

(ඉ) විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අධ්‍යනය හා සම්පාදන ව්‍යාපෘතිය හරහා නිම කළ යුතු වූ වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති මාලා 3 ක් වර්ෂය තුළ සකස් කර නොතිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල කළමනාකරණය

2015 ජුනි 09 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් “ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ” (Senior Scientist) තනතුරු 02 ක් අනුමත කර තිබුණද, 2017 ජුලි 31 දින එක් පුරප්පාඩුවක් සඳහා පමණක් බඳවා ගැනීම් සිදුකර තිබූ අතර ඉතිරි පුරප්පාඩුව සඳහා මෙම වාර්තාවේ දින වන විටත් බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. තවද Data Base Associater තනතුර 2017 සැප්තැම්බර් 03 සිට පුරප්පාඩුව පැවතියද මෙම වාර්තාවේ දිනවන විටත් ඒ සඳහා බඳවා ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 4.4 අරමුදල් ඌන උපයෝජනය

2017 වාර්ෂික අයවැය ලේඛණය මගින් පුනරාවර්තන වියදම් යටතේ සේවක අභිවෘද්ධිය වෙනුවෙන් (Staff Development) රු.10,000 ක්ද ප්‍රාග්ධන වියදම් යටතේ අටවන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව (BICOST – VIII) වෙනුවෙන් රු.300,000 ක් ද වෙන්කර තිබුණද එම සම්පූර්ණ මුදල

ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර සුභසාධන වැඩසටහන් සඳහා වෙන්කරගෙන තිබූ රු.200,000 ක මුදලකින් සියයට 98 ක් ප්‍රවර්තන වර්ෂය තුලදී උපයෝජනය කර නොතිබුණි.

**4.5 වාහන උපයෝජනය**

----------------------

කොමිෂන් සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් පිළිවෙලින් පිරිවැය රු.1,700,000 ක් හා රු.4,600,000 ක් වූ මෝටර් රථ 02 ක් ප්‍රවර්ථන වර්ෂය තුලදීද වෙන්කර තිබුණි. එහෙත් එම නිලධාරීන් දෙදෙනා පෞද්ගලික වාහන භාවිතා කර ප්‍රවාහන දීමනා ලබා ගැනීම හේතුවෙන් එම වාහන භාවිතාකර නොතිබූ අතර පිළිවෙලින් ප්‍රවර්ථන වර්ෂයේදී කි.මී.994 ක් හා කි.මී.660 ක් පමණක් ධාවනය කර තිබුණි. මේ හේතුවෙන් මෙම වාහන ඌන උපයෝජිතව පැවති අතර වාහන වෙනුවෙන් වෙන්කර සිටි රියදුරන්ගේ සේවයද කාර්යක්ෂමව ලබාගෙන නොතිබූ බව විගණයේදී නිරීක්ෂණය විය.

**5. තිරසාර සංවර්ධනය**

---------------------

**5.1 තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

--------------------------------------------

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතුකල යුතුව පවතින අතර ඒ අනුව සභාව විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම සිදුකර තිබුණි. එහෙත් හා එම ඉලක්ක ලඟාකර ගැනීමට සුදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීමේදී හා පෙර සුදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හා දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**6.1 අභ්‍යන්තර විගණනය**

------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 අනුව කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබූ අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු ආවරණය කර තිබුණි. එහෙත් අමාත්‍යාංශය මගින් විගණනය කිරීමට අදාල අභ්‍යන්තර විගණන වාර්තා මුදල් රෙගුලාසි 134(3) වගන්තිය අනුව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**6.2 ප්‍රසම්පාදනයන්**

-----------------

කොමිෂන් සභාව සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීමේ හා සනීපාරක්ෂක සේවා ලබාගැනීම සඳහා වූ ගිවිසුම්වල කාලසීමාවන් පිළිවෙලින් 2017 ජුලි 31 දින හා 2017 නොවැම්බර් 01 දින අවසන් වී තිබුණද 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව හා ගිවිසුම්වලට එළඹීමකින් තොරව එම සැපයුම්කරුවන්ගෙන් 2018 මැයි 31 දින දක්වාම නැවතත් එම සේවාවන් ලබාගෙන තිබූනි.

**7. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | අයවැය පාලනය | නිසියාකාරව ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | විද්‍යාත්මක කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |